කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම,
සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය
கைத்தொழில், வாணிப அலுவல்கள், நீண்டகாலமாக இடம்பெயர்ந்த நபர்களின் மீள்குடியேற்றம்,
கூட்டுறவுத்துறை அபிவிருத்தி, தொழில் பயிற்சி மற்றும் திறன்கள் அபிவிருத்தி அமைச்சு
MINISTRY OF INDUSTRY & COMMERCE, RESETTLEMENT OF PROTRACTED DISPLACED PERSONS,
CO-OPERATIVE DEVELOPMENT AND VOCATIONAL TRAINING & SKILLS DEVELOPMENT

| මගේ අංකය / எனது இல. / My No. | MIC/FIN/02/05/06 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2019.10. 14 |
|---|---|---|---|---|---|

**ලේකම්,**
සභානායක කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

**ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා නිරීක්ෂණ සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම.**

**යොමුව: පාර්ලිමේන්තු මහා ලේකම් ගේ 2019 අගෝස්තු 05 දිනැති ලිපිය**

යොමුගත ලිපිය මඟින් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2017 මූල්‍ය වර්ෂයට අදාළ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා නිරීක්ෂණ සඳහා වන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් අදාල අකෘති පත්‍රයට අනුව සකසන ලද පිළිතුරු වාර්තාවේ CD පිටපත් 260 ක් සහ මුද්‍රිත පිටපත් 15ක් මේ සමඟ කාරුණිකව ඉදිරිපත් කරමි.

රිෂාඩ් බදියුදීන් (පා.ම.)

කර්මාන්ත හා වාණිජ කටයුතු,දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන්
නැවත පදිංචි කිරීම,සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය.


| | | | | | |
|---|---|---|---|---|---|
| ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister | 011 - 2435248 / Fax : 2390885 | අමාත්‍යාංශය / அமைச்சு / Ministry | 011 - 2392149 / 011 - 2392150 / Fax : 2390941 | ලිපිනය / முகவரி / Address | තැ. පෙ. 570, 73/1, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව / த.பெ. இல. 570, 73/1, காலி வீதி, கொழும்பு 03, இலங்கை / P. O. Box 570, 73/1, Galle Road, Colombo 03, Sri Lanka |
| ලේකම් / செயலாளர் / Secretary | 011 - 2436123 / 011 - 2436124 / Fax : 2449402 | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail | secretarymid@gmail.com | | |

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

கைத்தொழில், வாணிப அலுவல்கள், நீண்டகாலமாக இடம்பெயர்ந்த நபர்களின் மீள்குடியேற்றம், கூட்டுறவுத்துறை அபிவிருத்தி, தொழில் பயிற்சி மற்றும் திறன்கள் அபிவிருத்தி அமைச்சு

**Ministry of Industry & Commerce, Resettlement of Protracted Displaced Persons, Co-operative Development and Vocational Training & Skills Development**

අංක 119 (4) දරන නියෝග ප්‍රකාරව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව
විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 114
දරන වාර්තාව සම්බන්ධයෙන්
ගනු ලැබූ පියවර හා නිරීක්ෂණ ඇතුලත් වාර්තාව - 2017

இலக்கம்  (4) 119கொண்ட நிலையக் கட்டளைக்கு இணங்க அரச
கணக்குகள் தொடர்பான செயற் குழுவினால் பாராளுமன்றத்தில்
சமர்ப்பிக்கப்பட்ட பாராளுமன்ற கூற்றுத் தொடர் இலக்கம் கொண்ட  114
அறிக்கை தொடர்பாக மேற்கொள்ளப்பட்ட செயற்பாடுகள் மற்றும்
அவதானிப்புகள் உள்ளடங்கிய அறிக்கை 2017

Observation and steps taken in respect of the report of Parliamentary Series
No. 114 of Parliament which presented by the
Committee for Public Accounts (COPA) as per the
Standing Order No 119(4) – 2017

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය
கைத்தொழில், வாணிப அலுவல்கள், நீண்டகாலமாக இடம்பெயர்ந்த நபர்களின் மீள்குடியேற்றம், கூட்டுறவுத்துறை அபிவிருத்தி, தொழில் பயிற்சி மற்றும் திறன்கள் அபிவிருத்தி அமைச்சு
MINISTRY OF INDUSTRY & COMMERCE, RESETTLEMENT OF PROTRACTED DISPLACED PERSONS, CO-OPERATIVE DEVELOPMENT AND VOCATIONAL TRAINING & SKILLS DEVELOPMENT

මගේ අංකය / எனது இல. / My No. } MIC/FIN/02/05/06 — ඔබේ අංකය / உமது இல. / Your No. } — දිනය / திகதி / Date } 2019.10.14

**රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් ස්ථාවර නියෝග 119(4) අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාව සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියා මාර්ග සහ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම**

පාර්ලිමේන්තු සැසි අංකය :-අංක 114 – 2019 වර්ෂය
ආයතනයේ නම :-කර්මාන්ත හා වාණිජ කටයුතු,දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම,සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

**(අ) කර්මාන්ත හා වානිජ කටයුතු,දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන අංශය**

| අංකය | 2017 මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය සහ කාර්ය සාධනය ඇගයීමේදී හඳුනාගත් අඩුපඩු | අඩුපාඩු නිවැරදි කිරීමට ගන්නා ලද ක්‍රියා මාර්ග / වර්තමාන තත්වය |
|---|---|---|
| 01. | අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට එළඹී තිබීම | මු.රෙ. 94(2) ප්‍රකාරව වාර්ෂිකව පුනරාවර්තනය වන සේවාවන් හෝ සැපයුම් සඳහා පවත්නා මුදල් වර්ෂයේ ඇස්තමේන්තු මුදල් ප්‍රතිපාදන දැක්වෙන විට සහ ඊළඟ මුදල් වර්ෂයේදී එබඳු වියදම් අපේක්ෂා කෙරේ නම් මු.රෙ.94(2) හි දක්වා ඇති පරිදි මු.රෙ. 94(1) ඡේදයේ විධි විධාන නොතකා ඊලග මුදල් වර්ෂය තුල බේරුම් කිරීමට සිදුවන බැරකමකට බැදිය හැක. ඒ අනුව කටයුතු කර ඇත. |


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister } 011 - 2435248, Fax : 2390885
අමාත්‍යාංශය / அமைச்சு / Ministry } 011 - 2392149, 011 - 2392150, Fax : 2390941
ලිපිනය / முகவரி / Address } තැ. පෙ. 570, 73/1, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව / த.பெ. இல. 570, 73/1, காலி வீதி, கொழும்பு 03, இலங்கை / P. O. Box 570, 73/1, Galle Road, Colombo 03, Sri Lanka
ලේකම් / செயலாளர் / Secretary } 011 - 2436123, 011 - 2436124, Fax : 2449402
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail } secretarymid@gmail.com

| | | |
|---|---|---|
| 02. | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ එවකට වර්ෂය ඉක්මා ඇති හිඟ ණය ශේෂ** | ඊ.කේ.ඩී. ප්‍රනාන්දු මහතා විසින් ලබා ගෙන ඇති රු.100,208.00 ආපදා ණය මුදල සඳහා මේ වන විට කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතර, ඔහු දෙවරක්ම ගරු අධිකරණයේ පෙනී නොසිටීම හේතුවෙන් 2011.06.07 දින වරෙන්තු නිකුත් කර ඇත. 2018.08.14 දින කොළඹ වංචා විමර්ශණ කාර්යාංශය ලිපියක් මගින් මේ පිළිබඳ විමසීම් කර ඇතත් ඒ සඳහා මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත. |
| 03. | **අමාත්‍යංශයේ 2017 වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රමාදවීම.** | 2017 වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව සැකසීමේදී භාෂා පරිවර්තනය කිරීමේදි ඇති වූ ප්‍රමාදය නිසා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රමාද වී ඇති අතර, 2018.09.28 දින සභා කාර්යාලය වෙත අදාල වාර්තා ඉදිරිපත් කර 2018.10.10 දින සභාගත කිරීමට කටයුතු කර ඇත. තවද ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයකින් තොරව නියමිත දිනට එම වාර්තා ඉදිරිපත් කිරීම සඳහා කටයුතු යෙදීමටද පියවර ගෙන ඇත. |

**<u>පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 114 යටතේ රජයේ ගිණුම් කාරක සභාවේ තුන්වැනි වාර්තාවේ නිරීක්ෂණ හා ගනු ලැබූ ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම</u>**

ශීර්ෂය :- **197 – (2017 වර්ෂය)**

අමාත්‍යාංශයේ නම :- **නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

**(ආ) වෘත්තීය පුහුණු නිපුණතා සංවර්ධන අංශය**

<table>
<tr><th>අනු අංකය</th><th>කාර්යසාධන ඇගයීම ප්‍රකාරව 2017 වර්ෂය සඳහා හඳුනා ගනු ලැබූ දුර්වලතා</th><th>දුර්වලතාවයන් මඟ හැරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හා වර්තමාන තත්ත්වය</th></tr>
<tr><td>1.</td><td>අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබීම.</td><td>පුනරාවර්තන වියදම් සඳහා දැරිය යුතු අත්‍යාවශ්‍ය වියදම් වෙනුවෙන් අනිවාර්යෙන්ම බැඳීම් ඇති කරගත යුතු වේ. නමුත් භාණ්ඩාගාර ප්‍රතිපාදන වල ඌනතාවය මෙන්ම පෙර වර්ෂයට අදාලව නොගෙවූ බිල්පත් ද මේ වර්ෂයේ ප්‍රතිපාදන යටතේ ගෙවීම් කිරීමට සිදුවීමත් මීට හේතුවී ඇති බව දන්වමි.</td></tr>
<tr><td>2.</td><td>වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ශේෂ පැවතීම.</td><td>රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේ අයකර ගත නොහැකි ණය ශේෂ ලෙස දැක්වෙන රු.415,750.00 ක හිඟ ණය ශේෂ පහත පරිදි වේ.
<table>
<tr><th>නිලධාරියාගේ නම</th><th>ණය වර්ගය</th><th>මුදල (රු.)</th><th>මුළු මුදල(රු.)</th></tr>
<tr><td>කේ.ගුණරත්න මයා</td><td>ආපදා ණය</td><td>34,740.00</td><td rowspan="2">285,080.00</td></tr>
<tr><td></td><td>දේපල ණය</td><td>250,340.00</td></tr>
<tr><td>ආර්.පියසිරි මයා</td><td>ආපදා ණය</td><td>-</td><td>78,715.00</td></tr>
<tr><td>අයි.එන්.කොඩිප්පිලි මයා</td><td>ආපදා ණය</td><td>-</td><td>51,955.00</td></tr>
<tr><td colspan="3">එකතුව</td><td>415,750.00</td></tr>
</table>
(i) කේ. ගුණරත්න මයා<br><br>
මෙම ආමාත්‍යාංශයේ රියදුරෙකු වශයෙන් සේවය කළ කේ. ගුණරත්න මහතා විසින් ලබාගෙන ඇති මේ වන තෙක් අයකර ගැනීමට නොහැකි වී ඇති ණය ශේෂය රු.285,080.00 කි. මෙම නිලධාරියා 1999/07/19 සිට සේවය හැරගොස් ඇති අතර, අයවියයුතු ආපදා ණය මුදල වූ රු.34,740.00 රබර් සංවර්ධන දෙපාර්තුමේන්තුවේදී ලබාගත් ණය මුදලකි.<br><br>
මේ වන විට, ණයගොනුව අපහරණය කර ඇති බැවින් ඇපකරු පිළිබඳ විස්තර ලබාදිය නොහැකි බව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අංක RDD/2/8-පොදු හා 2012.09.25 දිනැති</td></tr>
</table>

ලිපිය මඟින් දන්වා ඇත.

රු.250,340.00 ක් වූ දේපළ ණය මුදල මෙම අමාත්‍යාංශයේදී ලබාගෙන ඇතත්, මිලදී ගත් ඉඩමට අදාල ඔප්පුව ඇටෝර්නි බලය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කර නොමැත. මෙම ණය ශේෂයන් අයකර ගැනීම සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය විසින් කොළඹ දිසා අධිකරණයෙහි නඩු අංක: DMR/00620/14 යටතේ නඩු පවරා ඇත. එහෙත් ඒ වන විට මෙම නිලධාරියා මිය ගොස් තිබූ බැවින් ඔහු වෙනුවට ආදේශ කිරීමට යෝජිත උරුමකරුවන් හා ඔවුන් පදිංචි ග්‍රාම නිලධාරි වසම් පිළිබඳව තොරතුරු ප්‍රදේශීය ලේකම්, කිරිදිවැල වෙතින් විමසන ලදි. ඉන්පසු දොම්පෙ ප්‍රාදේශීය ලේකම්ගේ අංක 1/7/5/2 හා 2017.02.28 දිනැති ලිපිය මඟින් අප වෙත ඉදිරිපත් කර ඇති පරිදි 382 - වේරහැර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ පදිංචි කේ. ගුණරත්න නමැති අයගේ උරුමකරුවන් පිළිබඳ තොරතුරු පහත පරිදි අප වෙත වාර්තා කරන ලදී.

| සම්පූර්ණ නම | ලිපිනය |
|---|---|
| කරවිටගේ ඉන්ද්‍රජිත් රංජිත් ගුණරත්න | 64/ඒ, හංගමුව වත්ත, වේරහැර, පැපිලියවල |
| කරවිටගේ මහේෂ් සුරංජිත් ගුණරත්න | 64, හංගමුව වත්ත, වේරහැර, පැපිලියවල |
| කරවිටගේ ශ්‍යාමිල් නිරෝෂන් ගුණරත්න | 64, හංගමු වවත්ත, වේරහැර, පැපිලියවල |

ඒ අනුව උරුමකරුවන් පිළිබඳ තොරතුරු 2017.03.07 දින ජ්‍යෙෂ්ඨ සහකාර නීතිඥ, නීතිපති දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීමට කටයුතු කර ඇත.

**(ii) ආර්. පියසිරි මයා**

එවකට තරුණ කටයුතු අමාත්‍යාංශයෙහි රියදුරෙකු වශයෙන් සේවය කළ ආර්. පියසිරි මහතා විසින් ලබා ගෙන ඇති මේ වන තෙක් අයකර ගැනීමට නොහැකි වී ඇති ණය ශේෂය රු.78,715.00 කි.මෙම නිළධාරියා 2010.01.28 දින සේවය හැරගොස් ඇත. ණය අයකර ගැනීම සඳහා ආර්. පියසිරි මහතාහට නීතිපති අංක සී/71/2011(ජී) සහ 2014.06.16 දිනැති ලිපිය මඟින් 2014.06.11 වන දින රත්නපුර දිසා අධිකරණ නඩු අංක 27668/එම් කැඳවා ඇති අතර, අදාල ණය මුදල වාරික මඟින් ගෙවීමට යෝජනා කර එකගතාවය පළ කර ඇත. එහෙත් එම නිලධාරියා කිසිඳු මුදලක් මෙම අමාත්‍යාංශය වෙත ගෙවා නොමැති අතර එය රජයේ අධි නිතීඥ අමතා යවන ලද අංක 2/1/20/2/108 හා 2015.08.28 දිනැති ලිපිය මඟින් දැන්වීමට කටයුතු කර ඇත. එලෙසින්ම අදාල එකගතාව පරිදි පියසිරි මහතා කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අප විසින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ විමසමින් රජයේ අධිනීතිඥ,

| | | |
|---|---|---|
| | | නීතිපති දෙපාර්තුමේන්තුව අමතා යවන ලද මෙම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ අංක ADM/01/03/L - පොදු හා 2017.11.08 දිනැති ලිපිය සඳහා කිසිදු පිළිතුරක් නොමැති බැවින් පළමු, දෙවන සහ තෙවන සිහිකැඳවීම් පිළිවෙළින් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ සමාංකය හා 2017.12.12, 2018.01.17 සහ 2018.02.16 යන දිනැති ලිපි වලින් සිදුකර ඇතත් ඒ සඳහා ද කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත.<br><br>**(iii) අයි. එන්. කොඩිප්පිලි මයා**<br><br>නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ සේවයේ නියුතුව සිටි නිපුණතා සංවර්ධන සහකාර අයි. එන්. කොඩිප්පිලි මහතා වැටුප් රහිත විදේශ නිවාඩු ලබාගෙන විදේශ ගත වී නැවත සේවයට වාර්තා කර නොමැත. මෙම නිලධාරියාගේ අයවිය යුතු ආපදාණය ශේෂය වූ රු. 51,955/= අයකර ගැනීමට කටයුතු කිරීම සඳහා, නිලධාරියාගේ ණය ලිපි ගොනු අස්ථානගතව ඇති බැවින් ණය අයකර ගැනීම පිළිබඳ ඉදිරිකටයුතු සිදුකිරීමට අපොහොසත් වී ඇත.<br><br>දීර්ඝ කාලයක් තිස්සේ නඩු පවරා තිබුන ද මේ වනවිටත් අය කර ගැනීම පිළිබඳ පිළිතුරු නොලද බැවින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2019 අනුව මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය මත කපා හැරීම සඳහා කටයුතු කරමින් පවතින බව තවදුරටත් දන්වා සිටිමි. |

රිෂාඩ් බදියුදීන් (පා. ම)
කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ
පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන
සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය

රිෂාඩ් බදියුදීන් (පා.ම.)

කර්මාන්ත හා වානිජ කටයුතු,දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන්
නැවත පදිංචි කිරීම,සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු නිපුණතා සංවර්ධන අමාත්‍ය